# ''ප්‍රබුද්ධ'' දුටු වින්දනය සොයා යන සමාජීය මිනිසා

ජේ.එම්.සී.කේ. සෙනෙවිරත්න

ලාංකීය සිංහල ජන සමාජය තුළ හැදුණු වැඩුණු මිනිසා තම ජීවන ගංගාව ප්‍රකෘතිමත් කර ගැනීමට හා සාරවත් කර ගැනීම සඳහා බුදු දහමේ හරය උකහා ගත්හ. එය ඥානනීය වූ මනුෂ්‍යත්වයක් ගොඩනඟන්නට හේතු සාධක විය. සංතෘෂ්ටිය, විනෝදාස්වාදය වඩා මධ්‍යස්ථව විඳිමින්. එහි සැබෑ අරුත් අවබෝධ කරගන්නට බොහෝ සේ ඉවහල් විය. මහගමසේකරයන්ගේ ''ප්‍රබුද්ධ'' කෘතිය සන්තෘෂ්ටිදායක වූ ජීවිතය වඩා මධ්‍යස්ථව විඳිය යුතු ආකාරය හා සැබෑ වූ සමාජීය කතිකාවතක් ගෙන එනු ලබනන්නකි. මහාචාර්ය විමල් දිසානායකයන් මෙසේ සඳහන් කරයි. '' සතුටෙහි ගැටෙමින් පීඩනයට පත් වෙමින් දුක වැළඳගෙන උද්දාමයට පත් වෙමින් බහල තිමිර පටලයක් මැදින් ගමන් ගන්නා අපට කුරිරු දැත් විදා ලුහු බැඳ ගෙන එන අසහනයෙන් මිදෙනු වස් පිළිසරණක් ලද හැක්කේ කොහින්ද? මහගමසේකර කිවිඳුන් මෙම කාව්‍යයෙන් පවසන පරිදි පුද්ගල අනුභූක්තියෙහි පිහිටා පසක් කොටගත් බුදු දහමෙහි මානුෂික හරයෙකි'. පිටු 116කින් සමන්විත මෙම කෘතියෙහි ප්‍රකාශන අයිතිය ස්ටැම්ෆර්ඩ් ලේක් සමාගම සතු වේ. ප්‍රබුද්ධ ප්‍රබන්ධය තුළ ගලායන බුදු දහම ඇසුරු කරගත් මානසික වින්දනයේ සීමාවන් පිළිබඳව අවබෝධ කර ගනිමු.

සංගීතය වින්දනයට බොහෝ දෙනෙක් කැමතිය. ප්‍රිය සම්භාෂනයක දක්නට ලැබෙන ප්‍රධාන කාරණා වන්නේ මත්පැන් හා සංගීතයයි. උසස් ප්‍රභූ සමාජයේ මිනිසුන් ඉතා සෙමින් මත්පැන් තොලගාමින් සංගීතය ශ්‍රවණය කරන්නට මහත් වූ රුචිකත්වයක් දක්වති.''ආරංචියි ආටිස්ට් කෙනෙක් කියල - කියන්ඩකෝ සින්දුවක්'' ප්‍රභූ සමාජයේ මිනිසුන් තමන්ගේ සංතෘෂ්ටිය සඵල කර ගන්නේ ශාස්ත්‍රීය සංගීතය ශ්‍රවණයෙන් නොවන බවත් බටහිර සංගීතයෙන් බවත් කවියා මෙහි දී ගෙනහැර දක්වයි. ''ඇදුරු තුටු නොවෙතියි - නො සිතප සිප් නොදනිතියි - පොප් ගීයක් කියයි - කියා අප හැම දෙනාම හිතුවයි - පොප් ගීයක් - පොප් ගීයක් - සියල්ලෝම හඬ නැගූහ''. මිනිසුන් බොහෝ විට තම විශ්‍රාන්තිය පවතින්නේ මුදලේ බව සිතමින් තමන් ජීවත්ව සිටින මෙම කාලය තුළ උපරිම ලෙස කා බී විනෝද වී සතුට උදාකරගන්නට පෙළඹේ. ''හැම් බේකන් කන්න සල්ලි - ජින් ෂැම්පෙන් බොන්න සල්ලි- බල්ලො මරලා - හරි - සල්ලි හොයාලා - ඉන්න ටිකේ ඉමුකො සුදෝ ජොලිය දමාලා'' මිනිසා තමා සතුට සැප සොයා යනු ලබන්නේ ලෞකික වස්තූන් වෙත ය. ''මත් වී සුරා මති න් - මත් වී රාග මති න් - මත් වී ධන කාමයෙ න් - මත් වී බල කාමයෙ න්''. ග්‍රාමීය මිනිසා තම ජීවිතය ගැට ගසාගනු ලබන්නේ දහඩිය මුගුරු වගුරුවමිනි. උදෑසන අවදිවන ඔවුන් සන්ධ්‍යාභාගය තෙත් කය වෙහෙසා වැඩකර රාත්‍රී නින්දට සැපත් වේ. එය ඔවුන්ගේ දින චර්යාව වේ. ඉන් මිදී තම මානසික සුඛවිහරණය උදෙසා ඉඳහිට විනෝදගමනක් යාමට හෝ රසවත් කෑමක් පිළියෙල කර ආහාරයට ගන්නට රුචිකත්වයක් දක්වනු ලැබේ. '' ඉඳහිටල දවසක විනෝද ගමනක් යන කොට ඉඳහිටල දවසක රසවත් කෑමක් කන කොට'' සොබා දහම වින්දනයේ අපූරු කැඩපතකි. නිහඬ නිසංසල පරිසරය තුළ පවත්නා අපූරු සුවය විඳින්නට කිසිවෙක් අකමැති වන්නේ නැත. සමාජය නිර්මාණය වී ඇත්තේ විවිධ වූ පන්ති පරතරයන් අනුවය. එක් සමාජීය ස්ථර තුළ ජීවත් වන මිනිසාගේ මීළඟ අරමුණ වන්නේ, මීළඟ සතුට වන්නේ තවත් පියවරක් ඉදිරියට තැබීමයි. කවියා මෙම සමාජීය ස්වරූපය අපූරුවට විග්‍රහ කරනු ලැබේ. එය සමාජීය ස්ථරයන් උරුම කර ගැනීමේ සංතෘෂ්ටියයි. '' බිම ඉන්නෝ රිය තුළට නගින්නයි - නැග ගත්තෝ අසුනක් ලැබගන්නයි - අසුනක් ලද්දෝ කොනක් හොයන්නයි- දඟලත් පොරකන්- ලැබුණොත් තුටු වෙත්'' නිසංසල රාත්‍රිය, සඳ එළිය වැනි සොබා දහමේ අපූරු වස්තූන් තුළින් මිනිසා අපූරු මානසික නිදහසක් හා වින්දනයක් ලබයි. දිවා කාලය පුරාවට ගත මනස වෙහෙස වී පැමිණි පසු නිසංසල රැයක සඳ නැගි මොහොතක මිහිරි සීපද රාවයක් අසන්නට, එහි මිහිර විඳින්නට, විඳිමින් සංතෘෂ්ටිය ලබන්නට මිනිසා ප්‍රිය කරන්නේ ය. ''රැහැයි හඬ පසුබිම් කොට'' ඇසෙයි සීපද හඬක් ඈත වෙල් යායකින් - ඇසී එය ගෙවී යයි - අප හැම පතන - නිහඬ නිසසල නිවනට - අහෝ මේ නම් මහා සැපතක් ය'' සමාජය තුළ ජීවත් වන මිනිසා සැබෑවටම තම සතුට සොයාගන්නට ප්‍රයත්න දරන අයුරු බොහෝ අපූරු ලෙස පාඨකයා වෙතට ගෙන එන්නට මහගමසේකරයන් ඥානනීය වී ඇත. වින්දනය තමා තුළට නතු කරගන්නට මිනිසා දරන වෑයම පිළිබඳ සමාජීය කියැවීමක් ඔස්සේ පාඨකයාට ඥානනය කරන්නට '' ප්‍රබුද්ධ'' සමත්ව ඇති බැව් පැහැදිළිය.

මහගම සේකර (1977), ප්‍රබුද්ධ (ප්‍රථම මුද්‍රණය), ස්ටැම්ෆර්ඩ් ලේක් සමාගම.